# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 සැප්තැම්බර් මස 23 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.38 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරළගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ආනන්ද රංජිත් රූපසිංහ
ඇන්ටනී උපුල් රාජිත
ඇ.ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදේන විජේරත්න
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙෙනෙවිය
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී.අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මනෝ ගනේෂන්
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහේෂ් අල්මේදා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මෙහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් වනිගරත්න
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
ශ්‍රීනාත් පෙරේරා
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සුනිල් ජයමිණි
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
උදාර රත්නායක
එඩ්වඩ් ගුණසේකර
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
ගුණසිරි ජයනාත්
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
රජිත හපුආරච්චිගේ
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ශිරන්ත අමරසේකර
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
සුනිල් වටගල
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය

## 01. කාරක සභා වාර්තා :

2014.09.10 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

***පූ.භා. 10.30 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.19 ට යළිත් රැස් විය.***

## 02. පළාත් සභාවේ රැස්වීම

නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්] ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

*"2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් සම්බන්ධයෙන්, මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා 2014 සැප්තැම්බර් මස 10 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී එළඹුණු එකඟතාවයද, සැලකිල්ලට ගෙන 2014 දෙසැම්බර් මස 02, 03, 04 හා 05 යන දිනයන් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සහ ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 03. පළාත් සභාවේ කටයුතු :

නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්] ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

## 04. 2014 අංක .......... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම

නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ 2014 අංක ........ දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය" දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*2014.07.30 දින ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාවේ සඳහන් සංශෝධනයන්ට යටත්ව,*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. 2014 අංක .......... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම

නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්] පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"බස්නාහිර පළාතේ 2014 අංක ........ දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය" තෙවන වර කියැවීම සඳහා සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරනවා.*

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : ජීවන වියදම අඩුකර ජනතාවට සහන සැලසීම

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"මධ්‍යම රජය ජනතාව මත බදු බර පටවා ජනතාව අසීරුතාවයට පත් කර ඇති හෙයින් පළාතේ ආදායමෙන් පළාතේ පුරවැසියන්ට ජීවන වියදම අඩු කර අවශ්‍ය සහන ලබා දීමට කටයුතු කිරීම මැනවයි බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ. භා. 12.12 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [සයපාල කෝරලගේ] මහතා මූලාසනාරූඪ විය.***

***අ.භා. 12.36 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් අ.භා. 12.44 ට යළිත් රැස් විය.***

*"ජීවන වියදම අඩු කිරීම සඳහා රජය ගෙන යන වැඩ පිළිවෙළ ශක්තිමත් කර ජනතාවට ඉක්මණින් සහන ලබා දිය යුතු යැයි"* ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා විසින් සංශෝධනයක් ඉදිරිපත් කරන ලදී.

## 07. රීති අංක 09 යටතේ යෝජනාව :

රංජිත් සෝමවංශ ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"න්‍යාය පත්‍රයේ අංක XI සහ රීති අංක 30 හා 31 යටතේ ඉදිරිපත් වූ විෂයයන් පිළිබඳ වැඩ කටයුතු අංක 8 (5) හා 8 (6) රීතිවල විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වාගෙන යා යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 08. සභාව කල් තබන අවස්ථාවේ අසන ප්‍රශ්න :

***සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලාවට නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් වාචිකව පිළිතුරු [1] සපයන ලදී.***

***ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලාවට නිමල් ලාන්සා ගරු අමාත්‍යතුමා විසින් වාචිකව පිළිතුරු [2] සපයන ලදී.***

## 09. සභාව කල් තබන අවස්ථාවේ කළ යෝජනාව :

*අසෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 31 (ආ) යටතේ, වයස අවුරුදු 16 ඉක්ම වූ පාසල් හැර යන විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම වෙනුවෙන් මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය තුළ අක්කර 1 ¾ ක් පමණ ඉඩමක් සහිත දැස්ගම කණිෂ්ට විද්‍යාලය පවරා ගැනීම සම්බන්ධ යෝජනාව [3] ඉදිරිපත් කරන ලදී.*

***අ.භා.02.09 යෝජනාව සාකච්ඡා කොට අවසන් කරන ලදී.***

---

[1] 2014.09.23 වන දින නිල වාර්තාවේ පිටු අංක 55, 56 බලන්න.
[2] 2014.09.23 වන දින නිල වාර්තාවේ පිටු අංක 61, 62 බලන්න.
[3] 2014.09.23 වන දින නිල වාර්තාවේ පිටු අංක 65, 66 බලන්න.

## 10. කල් තැබීම :

අනතුරුව, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.10 ට, 2014 ඔක්තෝබර් මස 07 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.09.24
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/24
Minuts 2014.09.24 - Hansard Section